

# පමා නොවී එම් අකුරට

රසික සූරියආරච්චි ලියයි

## ටිකට් නැතුව කෝච්චියේ

දුම්රියේ ගමන් බිමන් යෑම, බස් රථ මගින් යෑමට වඩා අඩු වශයෙන් එක කරුණකින් හෝ පමණක් කාර්යක්ෂම ක්‍රමයකි. එනම්, දුම්රිය මාර්ගය එක දිගට එලා තිබීමත්, එහි සාමාන්‍යයෙන් මාර්ග භාධක සහ වාහන තදබදය නැතිවීමත් නිසා එක එල්ලේ ආරම්භයේ සිට ගමණාන්තය දක්වා යෑමට ඉඩ ලැබීමයි. දුම්රිය යනෙනතුරු අන් වාහන මාර්ග බාධක අසල නවතාගෙන සිටිය යුතුය. මා ආනන්දයේ ඉගෙනුම පිණිස ගිය කාලයේ එක දිනක් හෝ බස් රථයෙන් පාසල් ගමන කිරීමට නොසිතුවේ ඒ නිසාය. නිවසේ සිට බසයෙන් ගනේමුල්ල දුම්රිය නැවතුමට ගොස් එතැනින් මරදනට යෑම, අඩුම කාලයක් සහ මුදලක් වැයවෙන ක්‍රමය වූවා පමණක් නොව, අඩුම ගමන් විඩාවක් ලැබෙන ක්‍රමය ද වන බව මට හැඟී ගොස් තිබුණි.

එය තවත් වාසි සහගත වූයේ දුම්රිය සේවය මගින් පාසල් සිසුනට ලබාගත හැකිවූ මාසික වාර ප්‍රවේශ පත්‍ර නිසාය. මෙවැනි පහසුකමක් ලංගම බස් රථ ගමන සඳහා ද තිබුණි.

දුම්රිය වාර ප්‍රවේශ පත්‍රය ලබා ගැනීම සඳහා වූ මුද්‍රිත ෆෝර්මය සම්පූර්ණ කොට පාසලෙන් සහතික කොට ගෙන එය දුම්රිය පොලට ගෙන යා යුතු විය. දුම්රිය දෙපාර්තමේන්තුව ඉන් බලාපොරොත්තු වූයේ මේ වාර ප්‍රවේශ පත්‍ර ලබාගන්නා ළමුන් පාසල් සිසුන් ම බවට සහතික කිරීමයි. මේ ෆෝර්මය ලබා ගත හැකි වූයේ ද පාසලෙනි.

ආන්දයේ මේ රාජකාරිය බාර වී තිබුණේ වාණිජ අංශයේ ගුරුවරියකට බව මගේ මතකයයි. මෙහිදී, පාසල් පරිපාලනයේ වාණිජමය ඥාණය ද මොනවට ප්‍රදර්ශනය කෙරෙන කරුණක් වූයේ පාසල් සිසුන් ගෙන් පාසල් පහසුකම් ගාස්තුව අය කිරීම බාර වී තිබුණේද මෙම ගුරුවරියටම වීමයි. මේ මගින්, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ෆෝර්මය අත්සන් කිරීමේ සිසු අවශ්‍යතාවය ප්‍රාණ ඇපයට තබා ගණිමින්, පහසුකම් ගාස්තු නිසි පරිදි අයකර ගැනීමට පාසල් පරිපාලනයට ඉඩ ලැබුණි.

මගේ ඉහත ප්‍රකාශය පාසලේ අයිතිකරුවන් ලෙස ස්වයං"පත්වීම් ලබා ඇති අයගේ දැඩි කෝපයට ලක් වනු නියතය. නමුත් සත්‍යය නම්, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර අයැදුම් පත්‍රය සහතික කිරීම සහ පාසලේ පහසුකම් ගාස්තු එකිනෙක ඈඳීමේ ඒ ක්‍රියාව සිසුන්ට අනිසි බලපෑමක් ඇති කළ එකක් බවයි. එය කිසි-සේත්ම, දුම්රිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් නොවීය.

දුම්රියෙන් ගමන් කරන්නන් නියමිත පරිදි ගාස්තු ගෙවා ප්‍රවේශ පත්‍ර මිළදී ගෙන ඇත්දැයි සොයා බැලීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ක්‍රම දෙකක් අනුගමනය කරන ලදී. ඉන් එකක් නම්, බාප්පලා නමැති සුරතල් නමින් හැඳින්වුණු ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන් කණ්ඩායම් මගින් දුම්රිය තුල සහ දුම්රිය ස්ථානයෙන් පිටවීම් දෙරටු අසල හදිසි වැටලීම් කරවීමයි. එද මා කළ දුම්රිය ගමනේ සඳ නොමැකෙන ඉතා සුන්දර මතකයක් වන්නේ මේ බාප්පලා කණ්ඩායම් තම රාජකාරිය අවසාන වී මගීන්ගෙන් සමුගන්නා විට අනිවාර්යයෙන් ලැබුණු ආදරබර හූ සංග්‍රහයයි.

මීට අමතරව, දුම්රිය ස්ථානයේ පිටවීම් දෙරටු අසලදී ද ප්‍රවේශ පත්‍ර පරීක්ෂාව සිදුකෙරුණි. පිටවීමේ දෙරටුවල දී සිදුකළ යුතුව තිබුණු අනෙක් අනිවාර්ය කර්තව්‍යය නම් පාවිච්චි කළ ප්‍රවේශ පත්‍ර එකතු කිරීමයි. යාම සහ ඒම දෙකොටසම වලංගු ප්‍රවේශ පත්‍ර ද, සති සහ මාස වාර ප්‍රවේශ පත්‍ර ද එකල තිබුනේ වුවද, සාමාන්‍ය දුම්රිය ප්‍රවේශ පත්‍රයක් වළංගු වූයේ එක් ගමනක් සඳහා පමණකි. ගමන අවසානයේ අවලංගු ටිකට් පත් එකතු කළ යුතු වූයේ ඒවා වෙනත් පුද්ගලයෙකුට භාවිතා කළ හැකි නිසාය. දුම්රිය පොළට ඇතුළු වීමේ දී ද, අතර මගදී ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන් අතට පත් වූ විටද සිදුවූයේ ප්‍රවේශ පතේ කුඩා කොටසක් කපා දැමීමයි.

ටිකට් පත් පරීක්ෂාව, පිටවීමේ දෙරටු සීමිත සංඛ්‍යාවක් පමණක් තිබූ මරදන සහ කොටුව වැනි දුම්රිය ස්ථානයකදී සාර්ථක වුවද, පිටපලාත් වලදී දුම්රිය ස්ථාන බහුතරය මුළුමණින් සංවෘත ඒවා නොවුණු නිසා හිතාමතා ප්‍රවේශ පත්‍ර නැතුව ගමන් කරන්නන්ට නම් එයින් ගැලවීමට හොඳින් ඉඩකඩ තිබුණි.
මරදනේ දුම්ණිය ස්ථානයේ පිටවීම් දෙරටු ද්විත්වයේම මනා ලෙස ප්‍රවේශ පත්‍ර පණීක්ෂාව සිදුකළ ද, අනිවාර්යයෙන්ම, මාසික වාර ප්‍රවේශ පත් ක්‍රමය උපයෝගී කරගන්නා පාසල් සිසුවන් වූ අප එයට ලක් වූයේ නැත. අපි වීරයින් සේ පිටවීමේ සහ ඇතුළු වීමේ දෙරටුවල සිටින පරීක්ෂකයින් පසුකර ගියෙමු. අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිණීම සඳහා වාර ප්‍රවේශ පත්‍රය මගේ පාසල් සටහන් පොතක් තුල සුරැකිව තිබුණි.

පාසල් ගිය එක් දිනක වෙනදට වඩා කලින් පාසලෙන් පිටවී නිවස බලා යාමට මරදනෙන් දුම්රියකට නැගගත් මා දහවල් එකට පමණ ගනේමුල්ල දුම්රිය ස්ථානයෙන් බැස පිටවීමේ දෙරටුව කරා යන විට ද සිතා සිටියේ එලෙසමය. එනම්, දුම්රිය සහ බස් රිය වාර ප්‍රවේශ පත්‍ර මගේ රසායන විද්‍යාව සටහන් පොත ඇතුලේ සුරැකිව ඇති බවයි. දුම්රිය සේවකයා ගේ අභියෝගයට මුහුණ දී පොත් මිටිය පෙරලමින් බලන විට මට පෙනී ගියේ, එදින සාමාන්‍ය වේලාවට කලින් පාසලෙන් පිටත් වීමට සැලසුම් කර සිටි මා ඒ නිසාම, රසායන විද්‍යා සටහන් පොත රැගෙන ගොස් නැති බවය.



මගේ වාසනාවකට මෙන් උදෑසන බසයේ කොන්දෙස්තරවරයා ද, මරදනේ ටිකට් පරීක්ෂකවරයා ද පාසල් නිල ඇඳුම නිසා මට ටිකට් පරීක්ෂාවකින් තොරව ඒ ඒ ගමන් අවසාන කිරීමට ඉඩ දී ඇත.

"සීසන් එක ගේන්න අමතක වෙලා!" යයි මා කියූ විගසම දුම්රිය සේවකයා අවුරුදු පහළොවක් වයසැති මගේ අතින් තදින් අල්ලා ගත්තේ මා මහා හොරෙකු ලෙසට හඟවමිණි. "හා, යං! යං!!" ඔහු මා කැඳවා ගෙන ගියේ දුම්රිය ස්ථානධිපති කාර්යාලයටයි. වාසනාවකට මෙන් මේ අවේලාවේ දුම්රිය ස්ථානයේ වැඩි පිරිස-ක් නොසිටියෙන් මට එතරම් ලජ්ජාවක් ඇති නොවුණි.
දුම්රිය ස්ථානාධිපති කළ යුතුව තිබුණේ, මගේ නම සහ ඡායාරූපය සහිත පාසල් හැඳුණුම් පත හෝ ජාතික හැදුණුම්පත පරීක්ෂාකර බලා, පාසල් වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කළ ලේඛණයෙන් මා ඒ මාසය සඳහා වාර ප්‍රවේශ පත්‍රය ලබාගෙන ඇති බව තහවුරු කරගෙන මට පිටවී යාමට ඉඩ දීමයි. මගේ නමට ලියූ පාසලේ මුද්‍රාව සහ වාණිජ ගුරුවරිය ගේ අත්සන් සහතිකය සහිත අයැදුම් පතද එහි තිබිය යුතු විය. එහෙත් ඒ වෙනුවට ඔහු කළේ, මට රුපියල් විසි දෙකයි පණහක දඩයක් නියම කිරීමයි. මෙය මාසික වාර ප්‍රවේශ පත්‍රය මෙන් දෙගුණයක මුදලක් විය!

පාසල් පොත් මිටිය ඇපයට තබාගත් දුම්රිය ස්ථාධිපති මට නිවසට ගොස් මුදල් රැගෙන එන ලෙස අණ කළේය. අතේ තිබූ මුදලින් බස් රථයේ නැගී නිවසට ගිය මා අවශ්‍ය දඩ මුදල පමණක් නොව මගේ මාසික වාර ප්‍රවේශපත්‍රයද රැගෙන හැකි විගස ආපසු පැමිණියද, බුරුලක් දැක්වූයේ දුම්රිය ස්ථානාධිපති නොවේ.

මම දඩ මුදල දුම්රිය ස්ථානයට ගෙවා පොත් මිටිය ඇපයෙන් මුද ගත්තෙමි.

■

## සුබස් සිත්විලි



වි ක ධර්මබන්ධු

### සුභාෂිතයෙන්....

| | |
|---|---|
| මිනිස් හට සොඳුරු ගුන සහ නුගුන | ඇත |
| නිදෙස් කෙනකු මෙ දියත උපදිනේ | ඇත |
| වෙසෙස් සිනිඳු මුවරඳ බර සහස් | පත |
| කොරොස් නලින් යුතු වෙය් කටු පෙලිනි | යුත |

**මෙය ම ගැදි පැදියකින් :-**

මිනිස් හට
සොඳුරු ගුන සහ
නුගුන ඇත
නිදෙස් කෙනකු
මෙ දියත උපදනේ නැත
(වෙසෙස්) සිනිඳු මුවරඳ බර
සහස්පත
කටු පෙලිනි යුත
කොරොස් නලින් යුතු වෙය්.

**මෙහි අදහසඃ-**

මිනිසුන් කෙරෙහි යහපත් ගුන මෙන්ම අයහපත් ගුනද ඇත්තේ ය. දෙසක් නැති කෙනකු මෙලොව (නම) උපදින්නේ නැත. (බුදුන් වහන්සේ නම් කිසිදු දෙසක් නැති කෙනකු බව කියති.) (විශේශයෙන්) සිනිඳු වු රේනු පිරි ඇති නෙලුම කටු සහිත නටුවකින් යුක්තය.

**පැහැදුමඃ-**

මිනිස් හට, ගොන් හට, ඇත් හට, අස් හට ආදි වශයෙන් පියවියට හට නිපාතය එකතු කිරීමේ සිරිතක් සාමාන්‍ය වියහරේ දක්නට නැත. මිනිසුන්ට යන පදය නම් -මිනිස් හට" යනුවෙන් වෙනස් වේ. ගොනුට, ඇතුට, අසුට වැනි යෙදුම් සමහර පැරනි ගැදි පොත්වලද දක්නට ලැබේ.

කෙසේ වෙතත් මෙහි ඇති -මිනිස් හට" යන්නේ ඇත්තේ -මිනිසුන් හට" යන බහු වචන අර්තය බව මගේ හැඟීමය්. එහෙත් බොහෝ උගතුන් එහි තේරුමට -මනුශ්‍යයා හට" යන ඒක වචන අර්තය දී ඇත්තේ කවර හෙයින් දැය් මම නොදනිමි.

රස / නිරස, සුදුසු / නුසුදුසු, මනා / නොමනා, ගුන / නුගුන යනු වියහරේ පවතින රීතියය්. ගුනවත් යන්නේ සොඳුරු /මනා / යහපත් ගුන ඇති යන තේරුම ගැබ් වී ඇත. (සොඳුරු ලොප් කොට) -මිනිස්හට ගුන සහ නුගුන ඇත" යන්නේ ඇත්තේ එම තේරුමය්.

වෙසෙස් යන පදයෙන් මෙහි අදහසට එලියක් නොවැටේ. එය "සක්ක" පදයකි. -මකරන්ද" යන්න මුවරංද /මුවරද යන දෙවිදියටම වියහර වේ. " බාන්ඩ" බඩු විදියටත් "කන්ඩ" කඩ විදියටත් වියහරට පැමින ඇත.

ඉංගිරිසියෙන් "මෙරිගෝල්ඩ්" යනුවෙන් හැඳින්වෙන මල අප හඳුන්වන්නේ දස් මල හෝ දස් පෙති මල යනුවෙනි. දහසක් ම නැතත් ඒ මලක පෙති සිය ගනනක් ඇත. මෙහි
"සහස් පත" යනුවෙන් හඳුන්වන්නේ ඒ මල නොවේ; පෙති සියයක් වත් නැති නෙලුම් මලය්. බොහෝ පොත්වල දක්නට ලැබෙන්නේ -සියපත" යන වචනයය්.

නෙලුම් අලයේ මෙන්ම නෙලුම් දඬුවලත් නටුවලත් සිදුරු දක්නට ලැබෙන නිසා මෙහි "නල" යන්න යොද ඇතත් "රෝස මලේ "නලයෙ" කටු" නිවැරදි නොවේ.

කොරොස් යනු කර්කශ /රලු යන තේරුම ඇති පදයකි. ගොරහැඩි /කොරහැඩි යනුවෙන් එය සාමාන්‍ය වියහරේ පවතින්නේ.

මේ වන තෙක් මිනිසුන් සුදන - දුදන යනුවෙන් බෙද දැක්වූ මේ කතුවරයා මෙතැන ගසන්නේ අලුත් / වෙනස් පදයකි. උස් / මිටි, කලු / සුදු වශයෙන් මිනිසුන් බෙදන විදියට සුදනන් /දුදනන් වශයෙන් මිනිසුන් බෙද දැක්විය නොහැකි බව මා නොයෙක් වර කියා ඇත. බුදුන් වහන්සේ සර්වතෝබ දර කෙනැකැය් කියන නිසා මෙහි කියන විදියට -නිදෙස් කෙනකු මෙ දියත උපදනා නැත" යන්න සැකයට බාජන වේ. එසේම සුදන ගුනත් දුදන ගුනත් ඇති මිනිසුන් ගැන සිතා සු දු දන = සුදුදන යනුවෙන් අලුත් වචනයක් ද සඳ ගත හැකිය. කෙසේ වෙතත් බන පොතේත් සුබාෂිතයේත් ගැටුමට අත දමා අත පුලුස්සා ගැනීමට මම නොකැමැත්තෙමි.